**හපුතලේ නගර සභාව - 2022**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හපුතලේ නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට හපුතලේ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පෙර පාසැලට සහ ළමා උද්‍යානයට මිලදීගෙන තිබුණු රු.700,000 ක් වූ උපකරණ, ලීබඩු හා සවිකිරීම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | නගර සභාවට අයිතිව තිබුණු රු.3,080,000 ක් වූ ගිනි නිවන රථය,ට්‍රැක්ටර් ටේලරය සහ බවුසර් ට්‍රේලර් 02 ක් දේපළ පිරියත උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී නගර සභා මහජන පුස්තකාලයට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.93,730 ක් වූ පුස්තකාල පොත් 110 ක් දේපළ පිරියත උපකරණ සහ ප්‍රාග්ධන යෙදවුමට ආදායමෙන් දායකවීම ගිණුම්වල එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) මගින් රු.5,416,090 ක් සහ පළාත් පාලන ආයතනවලට තේරී පත් වූ කාන්තා නියෝජිතවරියන්ගේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ ලැබී තිබුණු රු.250,000 ක් මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශයේ ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | තැන්පත් ගිණුම් මගින් ගැලපීම් කර ඇති අතර, ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 06 කට අදාළව මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය අනුව ශේෂය හා උපලේඛන අනුව ශේෂය අතර එකතුව රු.61,235,584 ක නොසැසඳීම් නිරීක්ෂණය විය. | විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව සමඟ එකඟ වන බව. | ගිණුම් සසඳා නිවැරදිව ශේෂයන් ඇතුළත් කර ගිණුම් පිළියෙල කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු.13,742,936 ක් වූ වත්කම් විෂයයන් 04 කට අදාළව ශේෂය සනාථ කිරීම සඳහා මිලදී ගැනීමේ පිරිවැය හෝ තක්සේරු වාර්තා, උපලේඛන, අත්පත් කර ගැනීමේ පිරිවැය හෝ තක්සේරු වාර්තා, ලේඛන සහ උපලේඛන ඉදිරිපත් නොකිරිම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව සමඟ එකඟ වන බව. | ගිණුම් ශේෂ සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| මු.රෙ 571 | 2016, 2017 හා 2018 වර්ෂ වලදී තැන්පත් කර තිබුණු රු.47,823 ක පොදු තැන්පත් ශේෂ නියාදනය කර නොතිබුණි | නියමිත ක්‍රියාපටිපාටිය අනුව නිරවුල් කිරීමට ඉදිරියේදී කටයුතු කර ඇති බව. | කල් ඉකුත් වූ පොදු තැන්පත් නියාදනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,033,166 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 7,284,701 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් දිනට 31 මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,950,000 | 2,024,552 | 1,486,337 | 538,215 | 2,100,644 | 1,598,868 | 1,337,267 | 261,601 |
| (ii) | කුලී | 16,101,250 | 18,650,118 | 11,080,707 | 7,569,411 | 15,790,201 | 11,598,856 | 9,758,606 | 1,840,250 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 492,000 | 525,500 | 465,500 | 60,000 | 540,800 | 474,700 | 409,700 | 65,000 |
| (iv) | වෙනත් ආදායම් | 2,457,517 | 3,945,857 | 1,961,479 | 1,984,378 | 2,934,425 | 2,629,829 | 1,695,472 | 934,357 |
| | එකතුව | 21,000,767 | 25,146,027 | 14,994,023 | 10,152,004 | 21,366,070 | 16,302,253 | 13,201,045 | 3,101,208 |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 02 කට අධික කාලයක සිට පැවත එන හිඟහිටි කුලී රු.4,834,383 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි. | විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව සමඟ එකඟ වන බව. | හිඟ හිටි කඩ කුලී කඩිනමින් අය කර ගත යුතුය. |
| (ආ) | වසර 02 කට අධික කාලයක සිට පැවත එන සභාව සතු දේපළ බදුදීම වෙනුවෙන් අයවිය යුතු රු.1,541,673 ක් සමාලෝචිත වර්ෂයේදද අය කරගෙන නොතිබුණි. | -එම-. | හිඟ හිටි බදු මුදල් කඩිනමින් අය කර ගත යුතුය. |
| (ඇ) | 2007 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් නගර සභාවට අයත් තානායම පවරා දෙන අවස්ථාවේදී එම අධිකාරිය මඟින් නගර සභාවට ගෙවිය යුතුව තිබුණු රු.4,049,018 ක් අය කර ගැනීමට විගණිත දිනය වු 2023 මාර්තු 24 වනවිටත් කටයුතු කර නොතිබුණි. | -එම-. | නගර සභාවට අයවිය යුතු මුදල් අය කර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ වු මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ මාසිකව කසළ ටොන් 4500 ක් පමණ එක්රැස් වන අතර, කසළ හලන යන්ත්‍රයක්, ට්‍රැක්ටර් රථයක් සහ සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනෙක් සේවයේ යොදවා තිබුණි. 2020 හා 2022 වර්ෂ වලදී පොහොර මිටි 396 ක් නිෂ්පාදනය කර තිබුණද පොහොර නිෂ්පාදනය සම්බන්ධව විධිමත් වාර්තාකරණයක් සභාව මඟින් පවත්වා නොතිබුණි. ඒ අනුව වර්ෂය තුළ පොහොර නිෂ්පාදනයට වැය වන පිරිවැය හා පොහොර අලෙවියෙන් ලැබෙන ආදායම සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු ගණනය කිරීමට නොහැකිව තිබුණි. | විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව සමඟ එකඟ වන බව. | කසළ කළමනාකරණ කටයුතු පිළිබඳ විධිමත් වාර්තා පවත්වා ගත යුතුය. |
| (ආ) | 1980 අංක 47 දරන පාරිසරික පනතේ 23(ආ) අනුව නිකුත් කරන ලද අපද්‍රව්‍ය මෝචනය/බැහැරලීම සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. තවද, කොම්පෝස්ට් නිෂ්පාදනය කළ නොහැකි නොදිරන ඝන අපද්‍රව්‍ය විවෘත භූමියක බැහැරලීම සිදු නොකළ යුතු අතර, හැකිතාක් දුරට ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි ද්‍රව්‍ය වෙන්කර ප්‍රතිචක්‍රීයකරණයට යොමු කළ යුතු වුවද, එසේ කර නොතිබුණි. | -එම- | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් ටෙන්ඩර් කර ලබාදී තිබුණු මස්, මාළු අලෙවි කරන ස්ථාන 04 ක අපද්‍රව්‍ය මහජනතාවට පීඩාකාරී වන ලෙස ඒ අසළ කාණුවකට බැහැර කර තිබුණි. | -එම- | මහජනතාවට පීඩාකාරී නොවන ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 වර්ෂයේදී සිදු කරන ලද තක්සේරුවක් පදනම් කරගෙන වරිපනම් බදු අයකිරීමින් තිබුණි. | 2022 දෙසැම්බර් 13 දින නව දේපළ තක්සේරුවක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති බව. | වරිපනම් බදු කාලීනව තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී නගර සභා සීමාව තුළ සිදු කරන ලද සමීක්ෂණයකින් ව්‍යාපාර ස්ථාන 57 ක් වෙළඳ බලපත්‍ර ලබාගෙන නොතිබුණු ද නගර සභාව ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව සමඟ එකඟ වන බව. | සභා බල ප්‍රදේශයේ පිහිටි ව්‍යාපාර වාර්ෂිකව සමීක්ෂණය කර ඒවා නියාමනය කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 නොවැම්බර් මාසයේදී පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් හපුතලේ නගර සභාවට භාරදී තිබු කම්පැක්ටරය ලබාදුන් දින සිට සමාලෝචිත වර්ෂය දක්වාම වසර 08 ක් නිෂ්කාර්යව රථගාලේ ගාල් කර තිබුණි. | අපහරණය කිරීම සඳහා ඉල්ලීම් කර ඇති බව. | නිෂ්කාර්ය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2012 මාර්තු 05 දින හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව විසින් හපුතලේ නගර සභාවට භාරදී තිබුණු අත් ට්‍රැක්ටරය ලැබුණු දින සිට නිෂ්කාර්යව පැවතුණි. | -එම- | -එම- |